


## FREE VIEW

සම්මත රූපවාහිනී භාවිතාව තුළ සේවාව සපයන සමාගම විසින් සකස් කරන ලද කාලසටහනකට අනුව රූපවාහිනී වැඩසටහන් ග්‍රහණය කරගැනීමට ග්‍රාහකයාට සිදුවෙනවා.

කාර්ය බහුල ජීවිතයක් එදිනෙදා අත්‍යාවශ්‍ය වැඩකටයුතුත් නිසාම බොහෝමයක් අවස්ථාවල අපට අවශ්‍ය කරන රූපවාහිනී වැඩසටහන් නැරඹීමේ අවස්ථාව අප වෙතින් ගිලිහී යනවා.

2008 වර්ෂයේ නොවැම්බර් මස 24 වැනිදා හරියටම සවස 6.29 ට තත්පර 60 ක වෙළඳ දැන්වීමක් පළ කෙරුණා. මෙම දැන්වීම තුළින් ප්‍රකාශ කෙරුණේ Free view රූපවාහිනී සේවාව පිළිබඳවයි.

Free view සේවාව මගින් කැමති වේලාවක තමන් කැමති රූපවාහිනී වැඩසටහන කැමති උපකරණයක් තුළින් නැරඹීමේ ස්වාධීනත්වය සහ අධිකාරීත්වය පරිභෝජනය කරන්නා සතුවෙනවා.

මෙහි සම්මත රූපවාහිනී භාවිතාවට ප්‍රතිවිරුද්ධව පැතිකඩ ලෙස හඳුන්වන්නට පුළුවන්.

Digital Terrestrial Television Platform in Australia යන සංවිධානය හැඳින්වීම සඳහා Free view වෙළඳ නාමය යොදා ගැනුනා.

මෙම වෙළඳ නාමය 2008 වසරේ එළි දැක්වුවද ප්‍රථම Free view සේවාව ආරම්භ කෙරුනේ 2009 වසරේ මාර්තු මස 26 වැනිදා Channel 10 හි ක්‍රීඩා නාලිකාව විකාශයට පත් කරමිනුයි.



Free view සේවාව තවත් දියුණු තත්වයකට පා තබමින් 2014 වර්ෂයේදී Free view Plus සේවාව එළි දැක්වුනා. නවතම වාර්තාවලට අනුව Free view Plus සේවාව භාවිතා කරන ඕස්ට්‍රේලියානුවන්ගේ සංඛ්‍යාව ලක්ෂ 9ය ඉක්මවා තිබෙනවා.

දැනට ලෝකයේ රූපවාහිනී උපකරණ නිපදවන ප්‍රධානතම සමාගම් 10න් 08ක් Smart TV සඳහා Free view Plus උපාංගය ඇතුලත් කරනවා.

මෙම සේවාව සැපයීම සඳහා අන්තර්ජාලය උපයෝගී කරගත්තත් මෙය NETFIX වැනි Streaming හෙවත් ප්‍රවාහාත්මක සේවාවක් වන්නේ නැහැ. මෙයට Hybrid හෙවත් දෙමුහුන් සේවාවක් ලෙස හැඳිවීම වඩාත් උචිත වෙනවා.

Free view ලාබ නොලබන සංවිධානයක් ලෙස හඳුන්වන අතර, ABC, SBS, Channel 7, Channel 9, Channel 10, Prime Media Group iy South Cross Broadcasting යන නිදහස් රූපවාහිනී නාලිකා බලපත්‍රයන්ගෙන් සමන්විත වෙනවා.

සියළු නිදහස් රූපවාහිනී නාලිකා Free view වටා එකතමුතු වීමේ ශක්තිය තුලින් 2016 ආකර්ෂනීය මෙන්ම නව සොයාගැනීම් ඉදිරිපත් කෙරෙන වසරක් බව Free view සංවිධානයේ ප්‍රධාන විධායක නිළධාරිනී Liz Ross ප්‍රකාශ කර සිටියා.

වැඩිදුරටත් අදහස් දැක් වූ ඇය කියා සිටියේ Free view Plus Live Stream & Catch Up TV kñka Mobile App එකක් හෙවත් ජංගම යෙදුමක් නුදුරේදීම එළිදක්වන බවත් ඒ තුලින් ඕස්ට්‍රේලියාවේ සියළුම නිදහස් රූපවාහිනී නාලිකා සජීවීව තම ජංගම දුරකථනය හෝ ටැබ්ලට් පරිගණකය තුලින් නැරඹීමේ මහගු අවස්ථාව සියළු දෙනාටම නොමිලයේ උදාවන බවය.

---




# වධකයා සහ ඔහු ගේ බිරිඳ

මා කුඩා කාලයේ එක් දිනක්, අපේ බාප්පා " බුදු අම්මෝ!" යැයි මහ හඬින් කෑ ගසමින් තම කඩා වැටෙන සරම ද එක් අතකින් අල්ලාගෙන නිවසේ සිට වත්ත පහළට දිව යනු මට මතක ය. අප මවිතයට පත්කළ ඒ හැසිරීමට හේතුව ලෙස අපට පසුව අසන්නට ලැබුණේ, ඔහු ගේ කාමරයේ මකුළුවෙකු සිට ඇති බවයි.

සාමාන්‍යයෙන් කැරපොත්තන්, මකුළුවන් වැනි කෘමි සතුන්ට බියවන්නේ බහුතරයක් කාන්තාවන් ය. පිරිමින් අතර ද එවැනි දුබල සිතැති අය ඇති බවට අපේ බාප්පා සාක්ෂියකි. ඔහු මකුළුවෙකුට බයේ කෑ ගසමින් දිව ගිය එකම දිනය එද නොවේ.

අපේ බාප්පලා, නැන්දලා බිය වුව ද, ලංකාවේ දකින්නට නිවෙස් ආශ්‍රිතව ලැබෙන මකුළු වර්ග කිහිපය විෂ සහිතවුන් නොවෙන බව මගේ අදහසයි. එසේ නොවුනේ නම්, ලංකාවේ නිවාසවල මකුළු දැල් දකින්නට ඇති ප්‍රමාණය අනුව, මිනිසුන් නොමැරී ජීවත් වෙන්නේ කෙලෙසදැයි සිතා ගත නොහැකි වෙනු ඇත.

නමුත්, විසකුරු මකුළු වර්ග ද සිටිති. මා කුඩා කාලයේ කියවූ ජේම්ස් බණ්ඩා චරිතය සහිත චිත්‍රකතා පොතක දිවි මකුළුවා නම් විසකුරු එකෙකු සම්බන්ධ කොටසක් ද තිබුණි. ඒ මාරාන්තික මකුළුවා යොද අංගවිකල දරුවෙකු මරා දමන්නට කෙරුණු උත්සාහයක් ජේම්ස් බණ්ඩා නම් අපේ කාලයේ වීරයා අන්තිම තත්පරයේ දී ව්‍යවර්ථ කර දැම්මේය.

"ලයිසන්ස් ටු කිල්" හෙවත් මිනිසුන් මරා දැමීමේ ලයිසොමක් ඇති වධකයෙකු වූ ජේම්ස් බණ්ඩාට දිවි මකුළුවෙකු කජ්ජක් ද?

ඕස්ට්‍රේලියාවේ මකුළු වර්ග රාශියකි. ඉන් බොහෝ වර්ග විසකුරු නැතිමුත් විෂ සහිත එවුන් ගේ විෂ, ඉතා දරුණු විය හැක. එසේ වුවද, නපුරු දුදනන් ගේ සියොළඟෙහි ම විෂ ඇතිමුත්, මකුළුවන් ගේ විෂ ඇත්තේ එක් කුඩා තුඩක පමණක් නිසා, මකුළුවෙකු හැපීමෙන් මිය ගොස් ඇති මිනිසුන් සංඛ්‍යාව ඉතා අල්ප ය.

පසුගිය දිනක මා සේවය නිමවී නිවසට ළඟා වුයේ සවස හතහමාරට පමණය. සුපුරුදු පරිදි ආලිංගනයෙන් ද, දෙතොල් මත තැබුණු චුම්බනයකින් ද, මා පිළිගත් මා බිරිඳ වෙනදටත් වඩා ආදරයෙන් මා ඇමතුවා ය.



"අනේ රසී, ඔයා එනකං තමයි මං මේ බලාගෙන හිටියේ. තඩීම තඩි මකුළුවෝ දෙන්නෙක්ම ඉන්නවා. අනේ උංව අරං දන්න!" තරප්පුව යට ඇති කුඩා ගබඩා කාමරයේ දෙර දෙපැත්තේ සිවිලිමේ රැඳී සිටි මකුළුවන් දෙදෙනෙකු ඇය මට ඇඟිල්ලෙන් පෙන්නුවාය.

"මෙන්න මූ නම් රෙඩ් බැක් එකෙක් වගෙයි. අනිකා නම් ෆනල් වෙබ් එකෙක් ද මන්ද?”

හිස ඔසවා ඒ දෙස බැලූ මා දුටුවේ වෙනත් වර්ග දෙකක මකුළුවන් දෙදෙනෙකි. කලබලවීමට හේතුවක් තිබුණේ නැත.

වෙනදට මෙවැනි අවස්ථාවල දී මා කරන්නේ පරණ සිලි-සිලි බෑගයක් අතේ දමාගෙන මකුළුවා අල්ලා, ඌ බැගය ඇතුළට දමාගෙන කුණු බාල්දියට දැමීමයි.

නමුත් ඊයේ මා කළේ ගබඩා කාමරයෙන් කුඩා පියගැට ඉණිමගක් ගෙන ඒ මත නැග, මකුළුවන්ට මෝටීන් ප්‍රහාරයක් එල්ල කිරීමයි. සිහිසුන් වී බිම ඇද වැටුණු මකුළුවන් දෙදෙනා ඊළඟට සිලි-සිලි බැගයක් ඇතුළේ සැතපී කුණු බක්කියට විසිවිය. මකුළුවන්ට ඇගේ ඇති බිය හොඳින් මා දන්නා නමුත් මා බිරිඳ අමතා මෙසේ කීවෙමි.

"අයියෝ ඇයි ඔයා මං එනකල් හිටියේ ඕක කරන්න. මෝටීන් ටිකක් ගැහැව්වා නම් ඉවරයිනේ?"

"අනේ මට බෑ ඒවා කරන්න. පවුලේ හබියා ඉන්නේ ඒකට තමයි!" ඇය කීවා ය.

"ඒ කියන්නේ මං තමයි මේ ගෙදර වධකයා?"

"ඔව් ඔයා තමයි!" ඇය සිනාසෙමින් පැවසුවේ මා ඊළඟට කියන්නට යන දේ ගැන කිසිදු අදහසක් නොමැතිව ය.

"හොඳයි මං වධකයා නම්, මගේ බාරිය වෙන ඔයා කවුද?"

විරුද්ධවාදියා නිරුත්තර කරමින් මා එද දවසේ වාග් සංග්‍රාමය ජයගත්තේ එලෙස ය.